# ගැටුම් වළක්වා ගැනීම හා නිරාකරණය සඳහා දියුණු කළ යුතු පුද්ගල චර්යාවන් පිළිබඳ සංස්කෘත උපදේශ සාහිත්‍යාගත මඟපෙන්වීම

කරඳගොල්ලේ සෝභිත හිමි

## හැඳින්වීම

භාරතීය සාහිත්‍යය විවිධ විෂය ක්ෂේත්‍රයන් ඔස්සේ සුපෝෂිතව ලෝක සාහිත්‍යාවලිය තුළ අද්විතීය ස්ථානයක් හිමිකරගනී. නොයෙක් සාහිත්‍යාංගයන්ගෙන් උපලක්ෂිත තත් භාරතීය සාහිත්‍යයෙහි උපදේශ[1] සාහිත්‍යයට හිමිවන්නේ ප්‍රමුඛස්ථානයකි. තත් උපදේශ සාහිත්‍යාවලිය තුළ අන්තර්ගත මහාර්ඝ ග්‍රන්ථ ද්වයක් වන පඤ්චතන්ත්‍රය හා හිතෝපදේශය[2] නූගත් රාජ්‍ය පුත්‍රයන්ට නීතිශාස්ත්‍රය ඉගැන්වීම මුඛ්‍යාභිප්‍රාය කොට රචනා කොට ඇත. රාජ්‍ය පාලනයට අවශ්‍ය කරන දැනුමත් නීතිශාස්ත්‍රය පිළිබඳ දැනුමත් කථාන්දර සහ ශ්ලෝක උපයෝගී කරගෙන රාජපුත්‍රයන්ට ලබාදෙන්නේ අනාගතයේ රාජ්‍ය පාලන කටයුතුවලදී එමගින් අවශ්‍ය කරන මාර්ගෝපදේශකත්වය ලබාගැනීමට යි. එම කථාන්දර හා ශ්ලෝක මගින් රාජ්‍ය පාලනයේදී මුහුණදීමට සිදුවන හා විසඳීමට සිදුවන විවිධ ගැටුම්, එම ගැටුම් ඇතිවීමට මුල්වන හේතු, ගැටුම් නිරාකරණ කිරීම සහ නිරාකරණය සඳහා අවශ්‍ය කරන මාර්ගෝපදේශකත්වය ලබා දී ඇති නිසා ඒ ඒ අවස්ථාවන් තේරුම්ගෙන ගැටුමට අදාළ නිරාකරණ ප්‍රවේශය භාවිත කිරීමේ හැකියාව ලැබේ. එමෙන්ම ගැටුම් නිරාකරණය සඳහා උපයෝගී කරගැනීමට මාර්ගෝපදේශකත්වය සපයන න්‍යායාත්මක ක්‍රමවේදයන් රාශියක් ද හඳුනාගත හැකිවේ. මෙහිලා උත්සුක වනුයේ තත් කෘතිද්වයත් වෛරාග්‍ය හා නීති ශතක[3] යන ශතක ග්‍රන්ථ ද්වයත් ඇසුරෙන් ගැටුම් වළක්වා ගැනීම හා නිරාකරණය සඳහා දියුණු කළ යුතු පුද්ගල චර්යාවන් පිළිබඳ විමර්ශනයක යෙදීමටයි.

ලෝකයේ ජීවත් වන මිනිසුන්ට විවිධ අවස්ථාවන්හි මුහුණ දීමට සිදුවන සකලවිධ වූ සාමාජීය හා මානසික ප්‍රශ්නවලට හා ගැටුම්වලට විසඳුම් ඉදිරිපත් කිරීමට ගන්නා ලද ප්‍රයත්නයක ප්‍රතිඵලයක් වශයෙන්



උපදේශ සාහිත්‍යාගත උපදේශ කථා හා උපදේශ පාඨ හඳුන්වාදිය හැකිය. උපතේ සිට මරණය දක්වා මිනිසා විවිධ ගැටුම්කාරී තත්ත්වයන්ට ප්‍රශ්නවලට මුහුණ පායි. ගැටුම් නිරාකරණය යන්න උපදේශ සාහිත්‍යයට අනුව විමසා බලන විට පැහැදිලිව දැකිය හැකි කරුණක් වන්නේ කිසියම් පුද්ගලයෙකුට ගැටුම් මගහැර සිටීමට හෝ ඒවායෙන් පැනයාමට කිසිදු හැකියාවක් නොමැති බවයි. තම සාමාජීය ජීවිතයේ දී මිනිසාට විවිධ අවස්ථාවන්හි නා නා විධ ගැටලුවලට දුඃඛිත තත්වයන්ට මුහුණදීමට සිදුවීම සාමාන්‍ය වූ දෙයක් බව උපදේශ සාහිත්‍යය අවධාරණය කරයි.[4]


එමෙන්ම කිසියම් පුද්ගලයෙකුගේ සිත තුළ උපදින්නා වූ යම් යම් වැරදි ආකල්පයන් සක්‍රිය වී වර්ධනය වීමත් සමඟ අර්බුදකාරී හෙවත් ගැටලුකාරී තත්ත්වයන් ජනිත වන බව උපදේශ සාහිත්‍යය අවධාරණය කරයි. එවන් ගැටුමක් උපදේශ සාහිත්‍යයට අනුව කොටස් දෙකක් යටතේ විමසිය හැකි වෙයි.

1. පුද්ගල ආධ්‍යාත්මික ගැටුම්
2. අන්තර් පුද්ගල ගැටුම් යනුවෙනි.

ගැටුම් පිළිබඳ නූතන විග්‍රහයන්හිදී ද මෙම කොටස් දෙක කෙරෙහි අවධානය යොමු කොට ඇති බව පහත සටහනින් පැහැදිලි වෙයි.

''ගැටුමක් යනු අන්තර් පුද්ගල හෝ අන්තර් කණ්ඩායම් පදනමක් ඇතිව හටගන්නා වූ නිශ්චිත සම්බන්ධතා විශේෂයකි.''[5]

පුද්ගල අධ්‍යාත්මයෙහි හෙවත් සිතුවිලිවල හටගන්නා ගැටුම ඔහුගේ මානසික පසුබෑමක් වශයෙන් හඳුනාගත හැකි අතර පුද්ගලයාගේ මනසෙහි ඇති වන එම අර්බුදකාරී ආකල්පයන් හා හැඟීම් ඔහුගේ පාලනයෙන් ගිලිහී යන අතර එම ආකල්පයම පුද්ගල කණ්ඩායම් අතර ගැටුමක් දක්වා වර්ධනය වන ආකාරය උපදේශ සාහිත්‍යය තුළින් හඳුනාගත හැකිය.[6] කිසියම් සංසිද්ධියක් මුල්කොට පුද්ගලයා තුළත් පුද්ගල කණ්ඩායම් අතරත් ගැටුමක් ඇතිවන ආකාරය පහත රූප සටහනින් හඳුනාගත ගත හැකි ය.




මෙවන් ආකල්පයන් ඇතිවීම සඳහා බලපෑම් එල්ල කරන මූලික හේතුකාරණා නැතහොත් මූලික සාධක වන්නේ දූර්වල වූ නොපිරිපුන් චර්යාවන්ගේ මූලයන් ය. ලෝභය, ද්වේෂය සහ මෝහය හෙවත් අඥානකම මිනිසුන් තුළ අර්බුදකාරී ආකල්පයන් ඇතිකරවන පාපයන්ගේ මූලයන් ය. ඒ අනුව ගැටුම් ඇතිවීම කෙරෙහි බලපාන මූලික සාධක පාප ක්‍රියාවන්ගේ මූලයන් හා බැඳී ඇති බව ඒ. ජෝන් මැකනල් මහතා දක්වා ඇති පහත සඳහනින් පැහැදිලි වෙයි.

"ලෝභය හා මෝහය සුසංයෝග වීම හේතුවෙන් ලාභය හෝ පාඩුව මුල් තැන තබා ගන්නා ගැටුම්කරුවන් දුර්මුඛ තත්ත්වයට පත්කරනු ලැබේ. එසේ වනුයේ ද ඔවුන් විසින් අපේක්ෂිත යම් දෙයක් වීද, එය ලැබුණු පමණින්ම මොනයම් ක්‍රමයකින් හෝ තෘප්තිය ලැබෙතැයි යන අන්ධ විශ්වාසය දැරීම නිසාය. මේ තත්ත්වය හේතුවෙන් අපගේ සංජානන කේන්ද්‍රිය පටු කිරීමට බලපෑම් ඇති වන හෙයින් එහි ප්‍රතිඵලයක් වශයෙන් ප්‍රස්තුතයට අදාළව තිබිය හැකි



වෙනත් විසඳුම් සම්බන්ධයෙන් අප තුළ හැඟීමක් නොමැති වී යාමක් ද සිදුවෙයි. මනස නිර්මාණශීලී අංශයෙන් දුබල වනවාත් හැර එය උත්පාදනය කරගන්නා වෙනත් විභවතාවන්ගේ විවිධත්ව සීමාවන් ද පටු වී යන්නේ ය."[7]

පුද්ගල කණ්ඩායම් හෝ රාජ්‍යයන් අතර ගැටුම් ඇතිවීම සඳහා මූලික වශයෙන් බලපාන්නේ ලෝභය, ද්වේෂය හා මෝහය හෙවත් අඥානකම බව පහත මහාචාර්ය පී.ඩී ප්‍රේමසිරි පෙන්වා දෙන පහත ප්‍රකාශයෙන් ද පැහැදිලි වෙයි.

"යුද්ධයක් ගන්නා ස්වරූපය කුමක් වුව ද යුද්ධය ඇති කරවන්නේ දැඩි ලෝභය, ද්වේෂය, කෝපය හා මෝහය පදනම්කොට ගෙන ව්‍යාප්ත වී යන නොපිරිපුන් හෙවත් පහත් හැඟීම් පදනම් කොටගෙන ය."[8]

පාප ක්‍රියා මූලයන් මගින් සිදු කරනු ලබන්නේ පුද්ගලයාගේ මානසික පාරිශුද්ධතාව නැතහොත් ඔහුගේ හෘද සාක්ෂියේ නිකැලැල් භාවය විනාශකර දමා නොමඟ යැවීමයි. එනිසා තමා කරන හෝ සිතන දෙයෙහි සත්‍ය වශයෙන් ඔහු දකින යම් දෙයක් වේද ඒ සියල්ල සාවද්‍ය වෙයි. එහි ඇති යහපත් වූ නිකැළැල් වූ ඇත්ත නොදකී. මෙවන් අවස්ථාවක දී සිදුවන්නේ සමාජය වැරදි මාර්ගයේ ගොස් ගැටුමකට ඇදී යාමයි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් කෙනෙකුගේ කාර්යශූරත්වය නැතහොත් මානසික ශක්‍යතාවන් යටපත් වී යයි. එයින් ගැටුමක් සමනය කරගැනීමට අවශ්‍ය කරන ඉහළ මට්ටමේ විවෘත මානසික තත්වය මැකී යයි.[9] උපදේශ සාහිත්‍යය මගින් ආධ්‍යාත්මික වූ හෝ බාහිර වූ හෝ ගැටුමක් ඇති වූ විට එය වළක්වා ගැනීමට විවෘත මානසික තත්ත්වයක් හා පාරිශුද්ධ හෘදය සාක්ෂියක් තිබීමේ වැදගත්ම අවධාරණය කරයි.

"අධ්‍යාපනය, තපස, දානය, ඥානය, සීලය, ගුණධර්ම යන අංගවලින් තොරව ජීවත් වන්නෝ පොළොවට බරක් වූවාහු මිනිස් රුවෙන් මෙලොව හැසිරෙන සිව්පාවෝ ය."[10]

මෙමගින් උපදේශ සාහිත්‍යය අවධාරණය කරන්නේ ප්‍රඥාව හා මානසික ශක්තීන් ප්‍රධාන කරගත් උසස් ගුණාංග ගැටුම් නිරාකරණය සඳහා උපස්ථම්භක වන මූලසාධකයන් වන බවයි. එමෙන්ම,

1. පුද්ගලයාගේ චර්යාව

2. පුද්ගලයෙකු සතු බහුශ්‍රැත භාවය හෙවත් ඇසූපිරූ තැන් ඇතිබව මුල් කොටගත් ප්‍රඥාව ගැටුම් නිරාකරණ ක්‍රියාවලියේ දී අතිශය වැදගත් සාධකයන් වන බව වැඩිදුරටත් අවධාරණය කෙරේ. එයට හේතු වන්නේ ගැටුම් නිරාකරණ ක්‍රියාවලියේ දී කෙනෙකු වෙත මුලින්ම තිබිය යුතු ලක්ෂණය වන්නේ පිරිපුන් හා පැහැදිලි ඉලක්ක හා අරමුණු ඇති බවයි.

"ගැටලු නිරාකරණයෙහි නියුක්ත වන තුන්වන පාර්ශ්වකරුවකු තුළ පැවතිය යුතු මූලික හා ප්‍රාථමික ගුණාංගයන්ගෙන් එකක් යථෝක්ත කාරණයන් වීම එම අංශයේ නූතන ප්‍රවණතාවකි. ඔහු සතුව තිබිය යුතු වන්නේ මධ්‍යස්ථ වූත් සහේතුක වූත් ඉලක්කයන් ය. අරමුණු ය. ඔහු අන්තගාමියෙක් නොවිය යුතු ය. අදාළ ද්විපාර්ශ්වයන් අතර භේද ජනනය කෙරෙන ආකාරයේ කුපිතකාරි දෙබිඩි වදන් භාවිතයෙන් ඔහු වෙන්ව සිටිය යුතු ය. සාමයේත් සහජීවනයේත් අගය වටිනාකම ඉස්මතුකර දක්වන වදන් භාවිත කිරීමට ඔහු පරිස්සම් විය යුතු ය. ඒ අතරම ඔහුගේ කටයුතුවලින් ද තමා දෙපාර්ශ්වයේම යහපත පතා ක්‍රියා කරන බව ප්‍රකට විය යුතු ය. මෙයින් අදහස් කරන්නේ අගතිගාමිත්වයෙන් හා සීමාන්තිකවාදිත්වයෙන් තොරව කටයුතු කිරීම ය."[11] එනිසාම සංස්කෘත උපදේශ සාහිත්‍යයෙන් ද සමාජගත ගැටුම් නිරාකරණයෙහිලා ඇසූපිරූ තැන් ඇති ප්‍රඥාවන්ත පුද්ගලයන්ගේ ක්‍රියාකාරිභාවය ඉතා වැදගත් බව අවධාරණය කරයි.


උපදේශ සාහිත්‍යයට අනුව පුද්ගල ජීවිතය ධර්ම, අර්ථ, කාම හා මෝක්ෂ යන චතුර්වර්ග සම්පත්තිය ප්‍රධාන කොට පැවතිය යුතු ය. එසේ නොවන ජීවිතය හිස් වූවකි. ප්‍රයෝජනයෙන් තොර වූවකි.

"සුචරිතධර්මය, වස්තුව, කාමය, මෝක්ෂය යන මොවුන් අතුරෙන් යමෙකුට එකකුත් නැත්තේ ද ඔහුගේ ජන්මය එළුදෙනගේ ගෙලෙහි වූ තනය මෙන් ඵල රහිත ය."[12]

මෙම චතුර්වර්ග සම්පත් උදාකර ගැනීමට අනුගමනය කළයුතු ක්‍රියා පිළිවෙළ ද උපදේශ සාහිත්‍යය මගින් උගන්වා ඇත. එනම්



"විද්‍යාතොමෝ හික්මීම ලබාදෙන්නී ය. හික්මීම හේතුකොට ගෙන වස්තුව ආදිය ලැබීමෙහි සුදුසු ගුණවත් බවට පැමිණේ. ගුණවත් බව හේතුකොට ගෙන ධනයට පැමිණේ. ධනයට පැමිණීම හේතුකොට ගෙන සුචරිත ධර්මයෙහි හැසිරීමට ද ඒ ධර්මයෙහි හැසිරීම හේතුකොට ගෙන මෙලෝ පරලෝ සැපතට ද පැමිණෙයි.[13] ජීවිතය පරිපූර්ණ තත්ත්වයට පත් කරන මෙම ක්‍රියාපටිපාටිය අනුපූර්ව පිළිවෙළට ගොඩනගා ගන්නා එනම්,




යන නයින් මැනවින් අනුගමනය කරන පුද්ගලයා උදාර චරිතයකින් හෙබි අයෙකි. එවන් පුද්ගලයා තුළ ජාති, කුල, ආගම් භේද හා වෛරය, ක්‍රෝධය, ඊර්ෂ්‍යාව ආදිය දැකිය නොහැකි වෙයි. "උදාර චරිතය ඇත්තාට සමස්ත ලෝකයම එකම පවුලක් හා සමානය"[14] යනුවෙන් පැවසූ පරිදි සම මෙතින් හා සම කරුණාවෙන් යුක්තව සියලුදෙනා සමඟ කටයුතු කරයි. එවන් පුද්ගලයෙකු ගැටුම් හෝ කලහකාරී තත්වයන් ඇති කරගැනීමට උත්සුක නොවෙයි.

### අත්තූපනායික ධර්ම පර්යාය මත පිහිටා සිටීමේ වැදගත්කම

තමන් උපමා කොට සියලුදෙනා කෙරෙහි කරුණාවෙන්, දයාවෙන් හා අනුකම්පාවෙන් යුක්තව කටයුතු කිරීම ඉතා උසස් ක්‍රියාවක් බව උපදේශ සාහිත්‍යය මගින් උගන්වයි. තමන් වධ බන්ධනයන්ට හා හිංසාවන්ට නොකැමැත්තා සේම අනිකුත් අය ද

එයට අකැමැති වන්නේ යැයි තමන් උපමා කොට ගෙන හිංසාකාරී, කලහකාරී හා ගැටුම්කාරී චර්යාවන්ගෙන් වියුක්තව කටයුතු කිරීමට අවශ්‍ය කෙරෙන මාර්ගෝපදේශකත්වය මෙමගින් ලබාදෙයි.

"යම්සේ තමාගේ ප්‍රාණයෝ ඉතා ප්‍රිය වෙත් ද. අනෙක් සත්ත්වයන්ගේ ද ඒ ප්‍රාණයෝ එසේම ප්‍රියවූවෝ වෙත්. සත්පුරුෂයෝ තමා උපමා කිරීමෙන් සත්ත්වයන් කෙරෙහි අනුකම්පා කරති."[15]

"ඉල්ලූ විට නැතැයි කීමෙහි ද, දීමෙහි ද, සැපෙහි හා දුකෙහි ද, ප්‍රිය හා අප්‍රියත්වයෙහි ද සත්පුරුෂයා තමා හා උපමා කිරීමෙන් ස්වභාවය දැන ගනියි."[16]

"මෙතෙම තමාගේ කියා හෝ අනුන්ගේ කියා හෝ සැලකීම පටු අදහස් ඇත්තවුන්ගේ ගතියකි. එසේ වුවත් උත්තම සිරිත් ඇත්තවුන්ගේ වනාහි මුළු පොළවම එකම පවුලක් වශයෙන් සලකනු ලැබේ."[17]

"සියලු සත්ත්වයන් කෙරෙහි තමා කෙරෙහි මෙන් සලකයි නම්(දකී නම්) හෙතෙම පණ්ඩිතයෙකි."[18]

උක්ත පළමු ප්‍රකාශයෙන් පැහැදිලි කරන්නේ සත්පුරුෂයා තමන් උපමා කොට තමන්ගේ ප්‍රාණය හා සමානකොට සලකා අනෙකුත් සතුන්ගේ ජීවිතයන් හෙවත් ප්‍රාණයන් කෙරෙහි දයාව දක්වන බවයි. එයින් සියලුදෙනා කෙරෙහි මෛත්‍රී සහගත චේතනාවෙන් යුක්තව ක්‍රියා කරන අතර එවන් පුද්ගලයන් සිටින සමාජයක අනෙකුත් අයගේ ජීවිතයට හෝ ධනයට හෝ අනන්‍යතාවට හෝ හානිදායක ක්‍රියාවක් සිදුනොවේ. ගැටුම් හා කලහකාරී ස්වභාවයන්ගෙන් විනිර්මුක්ත සාමකාමී සමාජ වටපිටාවක් ඇති වේ.

එමෙන්ම ඉහත දෙවැනි, තෙවැනි හා සිව්වැනි ප්‍රකාශයන්ගෙන් අවධාරණය කරනු ලබන්නේ සත්පුරුෂයා තමාගේ මානුෂීය අවශ්‍යතාවන් හා තමන්ට මුහුණදීමට සිදුවන ජීවිතයේ විවිධ අවස්ථාවන් පිළිබඳ සලකා බැලීමෙන් එවන් අවස්ථාවන්ට මුහුණපාන අන්‍ය ජනයාටත් තමන්ට මුහුණපෑමට සිදු වූ දෙය වුවහොත් සිදුවන්නේ තමාට වූ දෙය ම යැයි අවබෝධ කරගෙන යහපත් ආකාරයෙන් අනුන්ට උදව් උපකාර කරමින් ජීවත් වීමට උත්සුක වන බවයි. එමෙන්ම



මුළු ලෝකයේම ජීවත් වන සියලුදෙනා තමාගේ පවුලේ අය මෙන් සලකා කටයුතු කිරීමට උත්සාහ කරයි. එකිනෙකාට උදව්උපකාර කරගන්නා දයාවෙන් පරිපූර්ණ අන්‍යෝන්‍ය සහයෝගිතාව අගයන පුද්ගලයන්ගෙන් සමන්විත එවන් සමාජය ද ගැටුම්වලින් තොර ය. සාමකාමී ය.

**ගුණධර්ම මත පිහිටා සිටීමේ වැදගත්කම**

උසස් ගුණධර්මයන් අගයමින් ගුණධර්මයන්ගෙන් සුපෝෂිත ජීවිත ගත කරන්නේ නම් එවන් සමාජ සාමකාමී වන බව උපදේශ සාහිත්‍යයෙන් අවධාරණය කෙරේ. සදුපදේශ සැපයීම සිදුවන්නේ ද එවන් සමාජයක්, රාජ්‍යයක් නිර්මාණය කිරීමේ අභිලාෂයෙන් ම ය. සීලය හෙවත් හික්මීම පුද්ගලයාගේ භෞතික දියුණුව සඳහා මෙන්ම ආධ්‍යාත්මික දියුණුව පිණිස ද හේතුවෙයි. උපදේශ සාහිත්‍යයට අනුව පුද්ගලයාගේ හික්මීම ඇති කරන්නේ ඔහු තුළ ඇති ප්‍රඥාවන්තභාවය යි.[19]

ප්‍රඥාවන්තභාවය මත ඇති කරගන්නා වූ එම හික්මීම හෙවත් කායික වාචසික සංවරභාවය පුද්ගලයාගේ දියුණුව සාක්ෂාත් කරයි. එවන් පුද්ගලයෝ ධර්මයෙහි හැසිරීම නිසා මෙලොව පරලොව සැප ලබති. එවැනි පුද්ගලයන්ගෙන් ශෝභිත සමාජය ගැටුම්වලින් වියුක්ත ය. එනිසා සිල්වත් බව නිතැතින් අගය කොට ඇත.

"අධ්‍යාපනය, තපස, දානය, ඥානය, සීලය, ගුණධර්ම යන අංගවලින් තොරව ජීවත් වන්නෝ පොළොවට බරක් වූවාහු මිනිස් රුවෙන් මෙලොව හැසිරෙන සිව්පාවෝ ය."[20]

ඉහත ප්‍රකාශයට අනුව එහි සඳහන් ගුණධර්මවලින් තොර මිනිස්සු සිව්පාවුන්ට සම වෙති. සිව්පාවුන්ගේ ස්වරූපය නම් එකිනෙකා කාකොටා ගනිමින් විනාශයට පත්කරගනිමින් කිසිදු අණක්ගුණක් නැතිව ජීවත් වීමයි. ගුණධර්මයන්ගෙන් තොර සිව්පාවුන් වැනි මිනිසුන් වෙසෙන රට ද, සමාජය ද නිතර අවුල් වියවුල්වලින් ගහණ වූ ගැටුම් කල කෝලාහලවලින් අතොරක් නැති වන බව මෙයින් අවධාරණය කරයි.

''යමෙකුට ධර්මයෙන් තොර වූ දින පැමිණෙත් ද, යත් ද, හෙතෙම ලෝකරුවෙකුගේ මයින හමක් මෙන් හුස්ම ගන්නේ නමුදු ජීවත් නොවෙයි.''[21]

''ධර්මයෙන් හීන පුරුෂයෝ පරාර්ථය පිණිස තිරිසනුන් මෙන් වෙති. මුත්‍ර හා මළපහ පිණිස ද හුදෙක් ආහාරය පිණිස ද මවන ලදි.''[22]

''මිනිසුන් අතර ධර්මය ඇත්තා ශ්‍රේෂ්ඨ ය.''[23]

''ජීවිතය නැතිවීම ඇති වූ කල්හි පවා නොකටයුත්ත නො කළ යුතුය. කළ යුත්ත අත් නො හළ යුතුය. මේ ධර්මතාව සදාතනික වූවකි.''[24]

ඉහත සඳහන් ප්‍රකාශයන්ගෙන් ධර්මයෙන් තොර පුද්ගලයාගේ ස්වරූපය කෙබඳු ද යන්න පැහැදිලි කරයි. ඒ අනුව යම් පුද්ගලයෙකු කෙරෙහි ධර්මය විද්‍යමාන නොවන්නේ ද ඔහුගේ ජීවිතයෙන් ද කිසිදු ඵලක් නොමැත. මයින හමක් මෙන් සුසුම් හෙළීම පමණක් සිදු කරයි. තිරිසන් සතෙකු හා සමාන ය. නමුත් ධර්මයෙන් යුක්ත නම් ඔහු ශ්‍රේෂ්ඨ අයෙක් වෙයි. එවැනි පුද්ගලයෙකු කෙරෙන් පමණි සමාජ සාධාරණත්වය, යහපත, සදාචාරය හා සාමකාමී බව අපේක්ෂා කළ හැකි වන්නේ. එමෙන්ම ධර්මයෙහි පිහිටා සිටින පුද්ගලයා තම ජීවිතය නැති වී ගිය ද නොකළ යුතු යැයි සම්මත දෑ නොකළ යුතු බවත් කළ යුතු ධාර්මික දෑ අත් නොහළ යුතු බවත් අවධාරණය කරයි. එහෙයින් ගුණධර්මවලින් අනූන පුද්ගලයෝ සාමකාමී සමාජයක් ගොඩනැගීමට අවශ්‍ය වෙති.

''තෘෂ්ණාව සිඳින්න. ඉවසීම ඇසුරු කරන්න. පාපයෙහි නො ඇලෙන්න. සත්‍ය කථා කරන්න. සත්පුරුෂ මාර්ගයේ ගමන් කරන්න. උගතුන් ඇසුරු කරන්න. පිදිය යුත්තන් පුදන්න. සතුරා වුවත් සනසන්න. තමන්ගේ ගුණ ප්‍රකට කරන්න. කීර්තිය පාලනය කරන්න. දුකට පත්වූවන් කෙරෙහි දයාවන්ත වන්න. මේවා සත්පුරුෂයාගේ ලක්ෂණ ය.''[25]

නීතිශතකයේ අන්තර්ගත උක්ත සදුපදේශයෙන් විස්තර කරන්නේ සත්පුරුෂයෙකු සතු විය යුතු ගුණධර්මයි. තත් ලක්ෂණයන් යම් සමාජ කණ්ඩායමක හෝ රටක සිටින මිනිසුන් අයත් වේ නම්



එවන් සමාජ කණ්ඩායමක් අතර රටක ජනයා අතර අසහනය, හිංසනය, භීෂණය හා ගැටුම්කාරී තත්ත්වයන් පැන නොනඟී. එකිනෙකාට ගරුකරන, ඉවසීම ප්‍රගුණ කරන, පවිටු ක්‍රියාවලින් වියුක්ත වූ සියලු දෙනා කෙරෙහි දයාවෙන් අනුකම්පාවෙන් කටයුතු කරන, පිදිය යුත්තන් පුදන පුද්ගලයන් අතර ගොඩනැගෙන්නේ සාමය, සාමදානය, සාධාරණත්වය හා සහෝදරත්වයයි. එවන් සමාජයක ගැටුම් නම් කොයින් ද. එනිසා ගුණධර්ම මත පිහිටා කටුයතු කරන මිනිසුන් ජීවත් වන සමාජය ගැටුම්වලින් තොර වන බව උපදේශ සාහිත්‍යාගත උක්ත ප්‍රකාශයන්ගෙන් අවධාරණය වන බව ගම්‍ය වෙයි.

එනයින් සලකා බලන විට යහපත් චර්යාවෙන් යුක්තව අත්තූපනායික ධර්මපර්යාය සහ ගුණධර්ම මත පිහිටා සිටිමින් ගැටුම් නිරාකරණය හා වළක්වා ගැනීමට කටයුතු කිරීම ඉතා ප්‍රශස්තතම ක්‍රමවේදය වශයෙන් සංස්කෘත උපදේශ සාහිත්‍යයෙන් උද්ධෘත යථෝක්ත කරුණු අනුව හඳුනාගත හැකි ය.

**ආන්තික සටහන්**

1. Sbdha Sagar, (ed.) Jibananda Vidyasagara Pandith, New Delhi, 1991, p 127. උප+√දිශ් ධාතුවට ඝඤ් ප්‍රත්‍යය එකතුවීමෙන් නිපන් උපදේශ යන්නෙන් 1. උපදේශය, අවවාදය, අනුශාසනාව, දැනමුතුකම, නිවේදනය, ආවේදනය, තොරතුරු දැන්වීම, ශික්ෂණය, පුහුණුවීම 2. කරුණු දැක්වීම 3. යමක් පිළිබඳ සපයනු ලබන සම්පූර්ණ විස්තරය, විශේෂ විස්තරය 4. ප්‍රථම පුහුණුව යනාදි අර්ථ ගෙනහැර දක්වයි.
2. සංස්කෘත උපදේශ සාහිත්‍යාගත කෘතීහු බොහෝමයක් වෙති. තත් කෘතීහු ආගමික, සාමාජික හා දේශපාලනාදී විවිධ විෂයක්ෂේත්‍රයන් අළලා පුද්ගල චරිත සංවර්ධනය පිළිබඳ වූ පරමාභිලාෂයෙන් සදුපදේශයන් සපයති. එයිනිදු පඤ්චතන්ත්‍රය හා හිතෝපදේශය දේශපාලන විෂයෙහිලා 'නීතිශාස්ත්‍ර' ඉගැන්වීම සඳහා රචනා කරන ලද මහාර්ඝ ග්‍රන්ථද්වයක් වෙයි. බෙරිඩේල් කීත් මහතාට අනුව පඤ්චතන්ත්‍රය උතුරු ඉනදියාවේ ක්‍රිස්තු වර්ෂ හතර වන හා එකොළොස් වන සියවස් අතර වාසය කරන්නට ඇතැයි සැලකෙන විෂ්ණුශර්මන් නම් පඬිවරයා විසින් ලියන ලද්දැකැයි සැලකේ. (A.B. Keith, A History of Sanskrit Literature, (London: Oxford University Press, 1920), P 246-263) එමෙන්ම හිතෝපදේශය නාරායණ ශර්මන් නම් පඬිවරයා විසින් උක්ත පඤ්චතන්ත්‍රය

හා වෙනත් ග්‍රන්ථයන් ඇසුරු කරමින් වෙනත් ක්‍රමවේදයන් ද භාවිත කරමින් රාජ්‍ය පාලනය සම්බන්ධ තොරතුරු ගෙනහැර දැක්වීම සඳහා රචිත ග්‍රන්ථයකි. විශේෂයෙන් පඤ්චතන්ත්‍රයේ හා හිතෝපදේශයේ අන්තර්ගතය පිළිබඳ මෙන්ම ඒවායෙහි සංස්කරණයන් රාශියක් ඇති හෙයින් ඒ පිළිබඳව ද විවිධ මතවාද දක්නට ලැබෙන බව Franklin Edgerton මහතා ඉතා දීර්ඝ වශයෙන් සිය The Panchatantra Reconstructed Vol. II නම් කෘතියෙන් ගෙනහැර දක්වයි. (Franklin Edgerton, The Panchatantra Reconstructed Vol. II, (An Austria American oriental Society, 1924), P 03-263.)

3. ''ශෘඞ්ගාර ශතකය, නීති ශතකය හා වෛරාග්‍ය ශතක යන ශතකත්‍රය වාක්‍යපදීය නම් ව්‍යාකරණ ග්‍රන්ථය රචනා කළ භර්තෘහරි නම් ව්‍යාකරණඥයාගේ කෘතීන් වශයෙන් විද්වත් සම්භාවනාවට පාත්‍රවෙයි.'' (ජයදේව තිලකසිරි, සංස්කෘත කාව්‍ය සාහිත්‍යය, කොළඹ, ලංකාවේ එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම,1961. පිටුව 98-99.)
4. वैराग्यशतकम्,(अनुवादकः), देवर्षिसना शास्त्रि, वारानसिः चौकम्ब अमरभारति प्रकाशनः, १९७९, १०७, ठ ५७. 57.p "आयुर्वर्षशतं नृणां परिमितं रात्रौ तदर्धं गतं तस्यार्धस्य परस्य चार्धमपरं बालत्ववृद्धत्वयोः ।शेषं व्याधिवियोगदुःखसहितं सेवादिभिर्नीयते जीवे वारितरङ्गचञ्चलतरे सौख्यं कुतः प्राणिनाम् ॥,
5. Jayadeva Uyangoda, Conflict Negotiation Mediation and Peace, Colombo: Social Scientists Association, 2003, P 03.
6. පඤ්චතන්ත්‍රයේ දන්තිල ගෝරම්භ කථාවේ දන්තිල විසින් තමාට නින්දාවක් සිදුකළේ යැයි සිතන ගෝරම්භ දන්තිලට විරුද්ධව කටයුතු කිරීමට පෙළඹීම හා එයින් පසු රජු හා දන්තිල අතර භේදය ඇති කිරීම. Pñcatantra, मित्रभेदम्, (ed.), M.R.Kale, Delhi: Motilal Banarsidass, 1912, P 22-26.
7. MacCannel A. John, Mindful Meditation, a hand book for Buddhist peace makers, Dehiwala: Buddhist Cultural Centre, Sri Lanka, 1995, P 66.,
8. Surakkulame Pemarathana & Raluwe Padmasiri, (ed.),.Studies in Buddhist philosophy and Religion, Collected papers of Professor P.D,Pemasiri, University of Peradeniya: Deparment of Pali and Buddhist Studies, 2006, P 302., මහරඹැවේ පාලිත හිමි, ගැටුම් නිරාකරණය (බුදුරජාණන් වහන්සේගේ එළඹුම් සහ නූතන එළඹුම්), පිටුව 62.
9. එම, පිටුව 62.
10. Nîti and Vaiirāgya Śataka of Bhartṛhari, (ed.), M.R Kale, Delhi: Motilal Banarsidass,1971, Nîti,13, P 08.
"येषां न विद्या न तपो न दानं –ज्ञानं न शीलं न गुणो न धर्मः । ते मृत्युलोके भुविभारभूता–मनुष्यरूपेण मृगाश्चरन्ति ॥"



11. මහරඹැවේ පාලිත හිමි, ගැටුම් නිරාකරණය (බුදුරජාණන් වහන්සේගේ එළඹුම් සහ නූතන එළඹුම්), කොළඹ 07, ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ, 2010, පිටුව 66.
12. Hitopadeśa of Nārāyaṇa, (ed.), M.R.Kale, (Delhi: Motilal Banarsidas, 1967), प्रस्ताविका, 26, P 1.
13. ऌघ्व्छ,प्रस्ताविका, ६,ठ१. "विद्या ददाति विनयं–विनयाद्याति पात्रताम् ।पात्रत्वाद्धनमाप्नोति–धनाद्धर्मं ततः सुखम् ॥"
14. Ibid, मित्रलाभः,७१ श्लोकः, ठ १५. "उदारचरितानां तु वसुधैव कुटुम्बकम् ॥"
15. ीघ्व्छ, मित्रलाभः,१२ श्लोकः, P 05. "प्राणा यथात्मनोऽभीष्टा–भूतानामपि ते तथा ।आत्मौपम्येन भूतेषु–दयां कुर्वन्ति साधवः ॥,
16. ऌघ्व्छ, मित्रलाभः,१३ श्लोकः, P 05. "प्रत्याख्याने च दाने च–सुखदुःखे प्रियाप्रिये । आत्मौपम्येन पुरुषः–प्रमाणामधिगच्छति ॥"
17. ऌघ्व्छ, मित्रलाभः,७१ श्लोकः, ठ १५. "अयं निजः परोवेति–गणना लघुचेतसाम् । उदारचरितानां तु–वसुधैव कुटुम्बकम् ॥,
18. Ibid, मित्रलाभः,१४ श्लोकः, ठ ०५. "आत्मवत्सर्वभूतेषु यः पश्यति स पण्डितः ॥"
19. Ibid, प्रस्ताविका, ६ श्लोकः, P 01.
20. Nîti and Vaiirāgya Śataka of Bhartṛhari, (ed.), M.R Kale, Delhi: Motilal Banarsidass,1971, Nîti 13, P 08.
"येषां न विद्या न तपो न दानं ज्ञानं न शीलं न गुणो न धर्मः ।
ते मृत्युलोके भुविभारभूता मनुष्यरूपेण मृगाश्चरन्ति ॥
21. ठ/चळपफळ्य, (ज्छ.), कढ.ऍग्न्ज, काकोलूकीयम्, 96, P 149.
"यस्य धर्मविहीनानि दिनान्यायान्ति यान्ति च । स लोहकारभस्त्रैव श्वसन्नपि न जीवति ॥,
22. Ibid, 100, P 149. "सृष्टा मूत्रपुरीषार्थमाहाराय च केवलम् । धर्महीनाः परार्थाय पुरुषाः पशवो यथा ॥"
23. ऌघ्व्छ, काकोलूकीयम् 99, P 149. "श्रेयान्धर्मस्तु मानुषात् ।"
24. Ibid, लब्धप्रणाशम्, ४९, ठ २०३. "अकृत्यं नैव कर्तव्यं प्राणत्यागेपि संस्थिते ।न च कृत्यं परित्याज्यं एष धर्मः सनातनः ॥"
25. "तृष्णां छिन्धि भज क्षमां जहि मदं पापे रतिं मा कृथाः–सत्यं ब्रूह्यनुयाहि साधुपदवीं सेवस्य विद्वज्जनान् । मान्यान्मानय विद्विषोऽप्यनुनय प्रख्यापय स्वान्गुणा– न्कीर्तिं पालय दुःखिते कुरु दयामेतत्सतां लक्षणम् ॥" Nîti and Vaiirāgya Śataka of Bhartṛhari, (ed.), M.R Kale, Delhi: Motilal Banarsidass,1971, Nîti- 77, P 31.

25 MAY 2022